**නිපුණතාව 04 පරිගණකය ආශ්‍රිත එදිනෙදා කටයුතු සඳහා යෙදුම් මෘදුකාංග යොදාගනී.**

**නිපුණතා මට්ටම 04.1 එදිනෙදා ලේඛන කටයුතු සඳහා වදන් සැකසුම් මෘදුකාංග යොදා ගනී.**

01. පහත ඒවා අතුරින් වදන් සැකසුම් මෘදුකාංගයක් නොවන්නේ,

| | |
|---|---|
| 01) Abi Word | 02) Frame Maker |
| 03) MS Powerpoint | 04) Openoffice Writer |

02. වදන් සකසන මෘදුකාංගයක් භාවිතයෙන් A හා B වගන්තිය හැඩසව් කර ඇත.

A වගන්තිය - *Type the poem*
B වගන්තිය - <u>Type the poem</u>

A වගන්තිය හා B වගන්ති වල හැඩසව් කිරීම සඳහා භාවිතා කළ මෙවලම් වන්නේ,

01) 
02) 
03) 
04) 

03. ලේඛනයක අඩංගු ඕනෑම පාඨයක් සොයාගැනීමට භාවිතා කළ හැකි යෙදුම වන්නේ,

| | |
|---|---|
| 01) copy | 02) paste |
| 03) find | 04) replace |

04. වදන් සැකසුම් මෘදුකාංග භාවිතයෙන් ලිපියක් සකස් කිරීමේදී යොදාගන්නා වචන වෙනුවට එම අදහස ගෙනදෙන වෙනත් වචන සොයාගැනීමට යොදාගත හැකි මෙවලම වන්නේ,

01) 

02) 

03) 

04) 


05. වදන් සැකසුම් මෘදුකාංගයක් භාවිතයෙන් සකස් කරන ලද ලේඛනයක ඇතුලත් කරන ලද පින්තූර සම්බන්ධව පහත ප්‍රකාශ සලකා බලන්න.

a) පින්තූර කිහිපයක් භාවිතා කර සංයුක්ත (Group) සකස් කළ හැක.
b) ලේඛනයේ පාඨ කොටසක පිටුපසින් එය ස්ථාන ගත කළ හැක.
c) පින්තූරයේ ප්‍රමාණය වෙනස් කළ හැක්කේ එහි සමමිතියට හානියක් නොවන පරිදි පමණි.

මෙම ප්‍රකාශ අතුරින් සත්‍ය වන්නේ,

| | |
|---|---|
| 01) a පමණි. | 02) a,b පමණි. |
| 03) b, c පමණි. | 04) a,b,c සියල්ලම සත්‍ය වේ. |

06. වදන් සැකසුම් මෘදුකාංගයක ලේඛනයක් යතුරුලියනය කිරීමේදී ctrl + h යතුරු සංයෝජනය එබීමෙන් විවෘත වන කවුළුව වන්නේ,

| | |
|---|---|
| 01) print | 02) open |
| 03) replace | 04) hyperlink |

07. වදන් සැකසුම් මෘදුකාංගයක ලේඛනයක් යතුරුලියනය කිරීමේදී පියවරක් ආපස්සට යාමට අදාල යතුරු සංයෝජනය වන්නේ,

| | | | |
|---|---|---|---|
| 01) | ctrl + x | 02) | ctrl + v |
| 03) | ctrl + z | 04) | ctrl + y |

08. ලිපියක් කිහිපදෙනෙකුට යැවීමට අදාලව වදන් සැකසුම් මෘදුකාංගයක් සතු පහත කවර ගුණාංගය භාවිතා කළ හැකිද?

| | | | |
|---|---|---|---|
| 01) | mail merge | 02) | macros |
| 03) | insert end note | 04) | manage source |

09. ස්වයංක්‍රියව අක්ෂර වින්‍යාස හා ව්‍යාකරණ දෝෂ සොයා ගැනීමට වදන් සැකසුම් මෘදුකාංගයක භාවිතා කළ හැකි යෙදුම වන්නේ,

| | | | |
|---|---|---|---|
| 01) | Find & Replace | 02) | Copy & Paste |
| 03) | Spelling & Grammar | 04) | Mail merge |

10. වදන් සැකසුම් මෘදුකාංගයක ලේඛනයක් මුද්‍රණය කිරීමට අදාල නිවැරදි පියවරෙහි අනුපිලිවෙල වන්නේ,

01) සෝදුපත් බැලීම, මුද්‍රණය කිරීම, මුද්‍රණ පෙර දසුන
02) මුද්‍රණ පෙර දසුන, සෝදුපත් බැලීම, මුද්‍රණය කිරීම
03) මුද්‍රණය කිරීම, මුද්‍රණ පෙර දසුන, සෝදුපත් බැලීම
04) සෝදුපත් බැලීම, මුද්‍රණ පෙර දසුන, මුද්‍රණය කිරීම

**නිපුණතා මට්ටම 04.2 සරල ගණිත ගැටලු විසඳීම සඳහා පැතුරුම්පත් මෘදුකාංග භාවිතා කරයි.**

01. පහත ඒවා අතුරින් විද්‍යුත් පැතුරුම්පත් මෘදුකාංගයක් නොවන්නේ,

| | | | |
|---|---|---|---|
| 01) | numbers | 02) | Libreoffice Calc |
| 03) | MS excel | 04) | Libreoffice Database |

02. විද්‍යුත් පැතුරුම්පත් මෘදුකාංගයක වැඩපතක් සමන්විත වන්නේ,

| | | | |
|---|---|---|---|
| 01) | පේළි සහ තීරු වලිනි. | 02) | තීරු සහ කෝෂ වලිනි. |
| 03) | පේළි සහ කෝෂ වලිනි. | 04) | කෝෂ වලින් පමණි. |

03. විද්‍යුත් පැතුරුම්පත් මෘදුකාංගයක වැඩපත තුළ සැරිසැරීමේදී දත්ත ඇතුළත් පරාසයෙහි අන්තය වෙත ගමන් කිරීමට,

| | | | |
|---|---|---|---|
| 01) | ctrl + home | 02) | ctrl + arrow keys |
| 03) | ctrl + end | 04) | ctrl + home |

04. විද්‍යුත් පැතුරුම්පත් මෘදුකාංගයක D2 කොටුවේ ඇති = $ B2 + C2 සූත්‍රය D3 කොටුවට පිටපත් කළ විට,

01) = $ B2 + C3 02) = $ B3 + C2
03) = $ B2 + C2 04) = $ B3 + C3

| | A | B | C |
|---|---|---|---|
| 1 | 1 | 2 | 3 |
| 2 | 4 | 5 | 6 |
| 3 | 7 | | |

05. ඉහත C3 කෝෂයෙහි = count (A1:B3) සූත්‍රය ඇතුළත් කළ විට C3 කෝෂයෙහි දැක්වෙන අගය වන්නේ,

01) 6 02) 5 03) 0 04) 19

06. ඉහත B3 කෝෂයෙහි = sum (A1:C2) සූත්‍රය ඇතුළත් කළ විට B3 කෝෂයෙහි දැක්වෙන අගය වන්නේ,

01) 6 02) 21 03) 15 04) 7

07. පැතුරුම්පත් මෘදුකාංගයක කෝෂයකට =(5 ^ 2) + (2 * 5) / 2 සූත්‍රය ඇතුළත් කළ විට කුමක් දිස් වේද?

01) 30 02) 15 03) 20 04) 22

| | A | B | C | D | E | F |
|---|---|---|---|---|---|---|
| 1 | | | | | | |
| 2 | Name | Science | English | ICT | Total | |
| 3 | Nimal | 80 | 45 | 74 | 199 | |
| 4 | Kamal | 56 | 70 | 87 | 213 | |
| 5 | Sunil | 67 | 53 | 47 | 167 | |
| 6 | | | | | | |

08. සිසුන්ට අදාල විද්‍යාව ලකුණෙහි වැඩිතම ලකුණ ලබාගැනීමට අදාල පැතුරුම්පත් ශ්‍රිතය වන්නේ,

01) = Sum (B3:B5) 02) = Count (B3:B5)
03) = Min (B3:B5) 04) = Max (B3:B5)

09. සිසුන්ගේ නම් සමඟ ලකුණු සන්සන්දනය කිරීමට භාවිතා කළ නොහැකි ප්‍රස්ථාර වර්ගය වන්නේ කුමක්ද?

01) Pie chart 02) Bar chart
03) Column chart 04) Line chart

10. පැතුරුම්පත් මෘදුකාංග සම්බන්ධ පහත වගන්ති සලකන්න.
a) සූත්‍රයක් සමාන ලකුණකින් ආරම්භ කරනු ලැබේ.
b) මෙහෙයවන ප්‍රමුඛතා අනුපිළිවෙලක් නොගනී.
c) සූත්‍ර පහසුවෙන් පිටපත් කිරීමට පිරවුම් හැඬලය භාවිතා කෙරේ.

මෙම ප්‍රකාශ අතුරින් සත්‍ය වන්නේ,

01) a පමණි. 02) a,b පමණි.
03) a, c පමණි. 04) a,b,c සියල්ලම සත්‍ය වේ.

**නිපුණතා මට්ටම 04.3 ඉදිරිපත් කිරීමක්, වඩාත් ආකර්ෂණීය ලෙස සිදු කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික සමර්පණ මෘදුකාංගයක් යොදාගැනේ.**

01. පහත සඳහන් ඒවා අතරින් සමර්පණ මෘදුකාංගයක් නොවන්නේ,

01) Apple keynote 02) MS powerpoint
03) Corel presentation 04) Access

02. කදාවක ඇති අනුරූපකයක් සීරුවෙන් වමේ සිට දකුණට චලනය කිරීම සඳහා විද්‍යුත් සමර්පණ මෘදුකාංග තුළ ඇති කුමන පහසුකම යොදාගනීද?

01) කදා පිරික්සුම 02) කදා සංක්‍රාන්තිය
03) සජීවනය 04) කදා සැලැස්ම

03. සමර්පණයක ඇති රාමු ගණන, දැනට තෝරාගෙන ඇති රාමුවේ අංකය, තෝරාගෙන ඇති භාෂාව ආදිය පෙන්වන ස්ථානය වන්නේ,

01) තත්ත්ව තීරුව 02) සටහන් කවුළුව
03) චිත්‍රක මෙවලම් තීරුව 04) දසුන් තීරුව

04. ඔබ කදා 10ක ඉලෙක්ට්‍රොනික සමර්පණයක 6වන කදාව තුළ අවසාන ඡේදය පිටපත් කර ctrl + A යතුරු සංයෝජනය භාවිතා කිරීමෙන් කුමක් සිදුවේද?

01) 6 වන කදාව සම්පූර්ණයෙන්ම තේරීම (select)
02) ටයිප් කරමින් සිටින ඡේදය සම්පූර්ණයෙන්ම තේරීම
03) සමර්පණයේ ඇති කදා 10ම එකවර සම්පූර්ණයෙන්ම තේරීම
04) සමර්පණයේ “A” අකුර යෙදෙන අවස්ථා සියල්ල පහසුවෙන් සොයාගත හැකිවීම

05. පහත ඡේදයේ P,Q,R හිස්තැන් වලට ගැලපෙන පිළිතුරු නිවැරදි අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
සමර්පණ මෘදුකාංගයක් මගින් කුඩා දරුවන් සඳහා විවිධ සතුන් පෙන්වීම සඳහා විද්‍යුත් සමර්පණයක් සකස් කරන්නෙකු ප්‍රථමයෙන් සමර්පණ මෘදුකාංගයකට පිවිස පළමු කදාවේ මාතෘකාව යතුරුලියනය කරයි. ඉන්පසු (P)……………. කෙටි මං යතුර/ යතුරු මගින් දෙවන කදාව ලබාගෙන අවශ්‍ය පරිදි හැඩසව් කරගනී. අනතුරුව (Q) ………. කෙටිමං යතුර/ යතුරු භාවිතා කර එම කදාවේ අනුපිටපත් 4ක් ලබාගෙන එක් එක් කදාවට අවශ්‍ය සතුන්ගේ පින්තූර යොදාගනී. ඉන්පසු (R)………… කෙටිමං යතුර/ යතුරු මගින් මෙම සමර්පණයේ කදා දැක්ම නරඹයි.

01) P – Ctrl + N, Q + Ctrl + C, R – F4
02) P – Ctrl + M, Q + Ctrl + D, R – F5
03) P – Ctrl + N, Q + Ctrl + D, R – F5
04) P – Ctrl + M, Q + Ctrl + C, R – F5

06. විද්‍යුත් සමර්පණ මෘදුකාංගයක කදාවක ශෛලිය (style) පිළිවෙලින් දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,

01) Slide sorter, Normal, Reading view, Slide show
02) Reading view, Slide show, Slide sorter, Normal
03) Normal, Slide sorter, Reading view, Slide show
04) Slide show, Normal, Slide sorter, Reading view

07. ගුණාත්මක ඊ-සමර්පණයක අඩංගු විය යුතු ලක්ෂණයක් නොවන්නේ,

01) එක් කදාවකට උචිත වන්නේ පේළි 6ක් 9ක් අතර ප්‍රමාණයකි.
02) චලන චිත්‍ර සහ වීඩියෝ එක් කදාවකට එකක් පමණක් ඇතුළත් කිරීම සුදුසුය.
03) අරමුණ ඉලක්කගත කිරීම කළ යුතුය.
04) විචිත්‍රවත් වර්ණ යෙදීම කළ යුතුය.

08. සමර්පණ මෘදුකාංගයක් භාවිතයෙන් සකස් කරන ලද කදාවක ඇති වස්තුවකට යොදන සජීවකරණ සම්බන්ධයෙන් පහත ප්‍රකාශ සලකා බලන්න.
a) එක් පින්තූරයකට සජීවීකරණ කිහිපයක් එක්වර ක්‍රියාත්මක කළ හැකිය.
b) පින්තූරයකට ලබාදුන් සජීවීකරණයන්හි වේගය පාලනය කළ හැක.
c) යම් පින්තූරයකට ලබාදුන් සජීවීකරණ අනුපිළිවෙල වෙනස් කළ හැක.

මෙම ප්‍රකාශ අතුරින් සත්‍ය වන්නේ,

01) a පමණි. 02) a,b පමණි.
03) b, c පමණි. 04) a,b,c සියල්ලම සත්‍ය වේ.

09. ඊ-සමර්පණයක ctrl + N යතුරු සංයෝජනයෙන්,

01) නව කදාවක් ඇතුළත් වේ.
02) නව සමර්පණයක් ආරම්භ වේ.
03) සමර්පණයට කදා සංක්‍රාන්තියක් ඇතුළත් කළ හැක.
04) සමර්පණය ඉවත් වී යයි.

10. සමර්පණයක මුද්‍රිත පිටපතක් ලබාගැනීම හා සම්බන්ධ වැරදි ප්‍රකාශය වන්නේ,

01) එක් කදාවක් පමණක් මුද්‍රණය කරගත හැක.
02) එක් පිටුවකට කදා කිහිපයක් වන සේ මුද්‍රණය කරගත හැක.
03) කදාවකට සටහනක් ඇතුළත් කර මුද්‍රණය කරගත නොහැක.
04) කදාවක ඇති චලන රූප මුද්‍රණය කරගත නොහැක.

**නිපුණතා මට්ටම 04.4 දත්ත සමුදායක ඇති දත්ත කළමනාකරණය සඳහා දත්ත සමුදාය කළමනාකරණ පද්ධතියක් භාවිතා කරයි.**

01. පහත සඳහන් ඒවා අතරින් දත්ත සමුදාය කළමනාකරණ පද්ධති මෘදුකාංගයක් නොවන්නේ,

01) MS Access 02) Base
03) Oracle 04) Calc

02. ඉලෙක්ට්‍රොනික දත්ත සමුදාය පද්ධතියක වාසියක් නොවන්නේ,

01) තොරතුරු සෙවීම අකාර්යක්ෂම වීම
02) උපස්ථ පිටපත් ලබාගැනීමේ පහසුව
03) දත්ත තැන්පත් කිරීමට වැඩි ආවයන ධාරිතාවක් වැයවීම
04) දත්ත වල ස්වායත්තතාව

03. අතුරු දත්ත සමුදායකට සාපේක්ෂව ඉලෙක්ට්‍රොනික දත්ත සමුදායක ඇති අවාසියක් වන්නේ,

01) කාර්යක්ෂමතාව හා නිරවද්‍යතාවය වැඩිවීම
02) දත්ත විශ්ලේෂණය පහසු වීම
03) දත්ත තැන්පත් කිරීමට වැඩි අවකාශයක් අවශ්‍ය නොවීම
04) පරිගණක තාක්ෂණය පිළිබඳ දැනුම අවශ්‍ය වීම

04. දත්ත සමුදාය පද්ධතියක මුද්‍රිත පිටපතක් ලබාගැනීමට වඩාත් සුදුසුම වන්නේ,

01) Table භාවිතය  02) Forms භාවිතය
03) Reports භාවිතය  04) Query භාවිතය

කිරිපිටි වෙළඳසැලක භාවිතා වන දත්ත පාදක වගුවක කොටසක් පහත දැක්වේ.
විකුණුම් වගුව :

| Product ID | Barcode | Food Description | Suppld | Cost Price | Sale Price |
|---|---|---|---|---|---|
| 11250 | 1112 | AB Milk Powder 400g | 0102 | Rs. 370/= | Rs. 390/= |
| 11250 | 1113 | AB Milk Powder 800g | 0102 | Rs. 840/= | Rs. 890/= |
| 11250 | 1114 | AB Milk Powder 400g | 0105 | Rs. 350/= | Rs. 370/= |

05. ඉහත වගුවෙහි ප්‍රාථමික යතුර සඳහා යෝග්‍ය ක්ෂේත්‍රය කුමක්ද?

01) Product ID  02) Barcode
03) Cost Price  04) Suppld

06. ඉහත වගුවෙහි ආගන්තුක යතුර සඳහා යෝග්‍ය ක්ෂේත්‍රය කුමක්ද?

01) Sale Price  02) Barcode
03) Cost Price  04) Suppld

| Student admission Number | Name | DOB |
|---|---|---|
| S 2010 – 01 | Uma | 21/10/2003 |
| S 2010 – 02 | Kamani | 26/11/2003 |
| S 2010 – 03 | Priya | 25/02/2003 |
| S 2010 – 04 | Dilani | 12/05/2004 |

07. දී ඇති වගු කොටසේ දත්ත ගබඩා කර ඇති රෙකෝඩ සංඛ්‍යාව කීයද?

01) 1  02) 4  03) 3  04) 6

08. දී ඇති වගු කොටසේ දත්ත ගබඩා කිරීම සඳහා කොපමණ ක්ෂේත්‍ර (Fields) සංඛ්‍යාවක් භාවිතා කර තිබේද?

01) 1 02) 4 03) 3 04) 6

පාරිභෝගිකයින් පිරිසක් ආහාර වෙළඳසැලකින් ආහාර ඇණවුම් කිරීම පිළිබඳ දත්ත පාදකයක ඇති වගු දෙකක් පහත දැක්වේ.

ඇණවුම් වගුව

| CustomID | Foodcode | Amount |
|---|---|---|
| 1001 | A22 | 2 |
| 1002 | A23 | 4 |
| 1004 | A22 | 3 |
| 1001 | A25 | 2 |

ආහාර වගුව

| Foodcode | Food Name |
|---|---|
| A22 | Fried Rice |
| A23 | Pizza |
| A24 | Rice & Curry |
| A25 | Icecream |

09. ඉහත ඇණවුම් වගුව හා ආහාර වගුව සම්බන්ධයෙන් පහත දී ඇති වගන්ති අතුරින් අසත්‍ය වගන්තිය කුමක්ද?

01) ඇණවුම් වගුවේ පවතින CustomID හා Foodcode සංයුක්ත යතුරකි.
02) ඇණවුම් වගුවේ Foodcode යනු ආගන්තුක යතුරකි.
03) ඇණවුම් වගුව හා ආහාර වගුව අතර බහු සම්බන්ධතාවයක් පවතී.
04) ඇණවුම් වගුවේ පවතින Foodcode ප්‍රාථමික යතුරකි.

10. ආහාර වගුවේ පවතින Foodcode ක්ෂේත්‍රය සඳහා සුදුසු දත්ත ප්‍රරූපය කුමක්ද?

01) Number 02) Memo
03) Text 04) Currency

# පිළිතුරු

**නිපුණතා මට්ටම 04.1 එදිනෙදා ලේඛන කටයුතු සඳහා වදන් සැකසුම් මෘදුකාංග යොදා ගනී.**

01. 03) MS Powerpoint
02. 01) 
03. 03) find
04. 01) 

05. 02) a,b පමණි.
06. 03) replace
07. 03) ctrl + z
08. 01) mail merge
09. 03) Spelling & Grammar
10. 04) සෝදුපත් බැලීම, මුද්‍රණ පෙර දසුන, මුද්‍රණය කිරීම

**නිපුණතා මට්ටම 04.2 සරල ගණිත ගැටලු විසඳීම සඳහා පැතුරුම්පත් මෘදුකාංග භාවිතා කරයි.**

01. 04) Libreoffice Database
02. 01) පේළි සහ තීරු වලිනි.
03. 03) ctrl + end
04. 04) = $ B3 + C3
05. 02) 5
06. 02) 21
07. 01) 30
08. 04) = Max (B3:B5)
09. 01) Pie chart
10. 03) a, c පමණි.

**නිපුණතා මට්ටම 04.3 ඉදිරිපත් කිරීමක්, වඩාත් ආකර්ෂණීය ලෙස සිදු කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික සමර්පණ මෘදුකාංගයක් යොදාගැනේ.**

01. 04) Access
02. 03) සජීවනය
03. 01) තත්ත්ව තීරුව
04. 02) ටයිප් කරමින් සිටින ඡේදය සම්පූර්ණයෙන්ම තේරීම
05. 02) P – Ctrl + M, Q + Ctrl + D, R – F5
06. 03) Normal, Slide sorter, Reading view, Slide show
07. 04) විචිත්‍රවත් වර්ණ යෙදීම කළ යුතුය.
08. 04) a,b,c සියල්ලම සත්‍ය වේ.
09. 02) නව සමර්පණයක් ආරම්භ වේ.
10. 03) කඳාවකට සටහනක් ඇතුළත් කර මුද්‍රණය කරගත නොහැක.

**නිපුණතා මට්ටම 04.4 දත්ත සමුදායක ඇති දත්ත කළමනාකරණය සඳහා දත්ත සමුදාය කළමනාකරණ පද්ධතියක් භාවිතා කරයි.**

01. 04) Calc
02. 01) තොරතුරු සෙවීම අකාර්යක්ෂම වීම
03. 04) පරිගණක තාක්ෂණය පිළිබඳ දැනුම අවශ්‍ය වීම
04. 03) Reports භාවිතය
05. 02) Barcode
06. 04) SuppId
07. 02) 4
08. 03) 3
09. 04) ඇණවුම් වගුවේ පවතින Foodcode ප්‍රාථමික යතුරකි.
10. 03) Text


**සකස් කළේ -**

**ප්‍රදීප් නන්දසේන මයා,**
**ර/මාරපන ම.වි.**